# අනූව දශකයෙහි සිංහල නවකතාකරුවා දුටු කොලනි ජීවිතය

චම්පා ශ්‍රියානි ද සිල්වා

**සාරාංශය**

මානව හා සමාජ විශ්ලේෂණ කර්තව්‍යයෙහි නිමග්න සාහිත්‍යාංග අතරින් සිංහල නවකතාවට ද හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. එය වත්මනෙහි වඩාත් ජනප්‍රිය වූ සාහිත්‍යාංගයක් වන අතර ම මානව හා සමාජ විවරණයෙහි ලා දැවැන්ත වේදිකාවක් බවට ද පත් වෙමින් තිබෙන අයුරු විද්‍යමාන ය.

වරෙක ජීවිතයට පෙම් බඳින මිනිසා අනවරත ගැටලු හමුවේ වරෙක ජීවිතයෙන් පලා යාමට තැත් දරන අයුරු, විවිධ වූ බලවේගයන් හේතු කොට ගෙන ආත්මීය වේදනාවට පත් ගැහැනුන්, මිනිසුන් දස දහස්වර සිතින් මිය යමින් ජීවිත මහෝඝයෙහි වල්මත් වන අයුරු, ජීවිත අරගලය හමුවේ මිනිසාගේ ක්ෂුද්‍රත්වය සහ පොදුවේ සමාජ විවරණ කර්තව්‍ය කියා පෑමට නවකතාකරුවාට නවකතාව නමැති සාහිත්‍යාංගය කදිම වූ තෝතැන්නකි.

## හැඳින්වීම

අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රියා පටිපාටිය හේතු කොට ගෙන ස්වදේශීය ජනතාවට මුහුණ පෑමට සිදු වූ ප්‍රශ්න විවිධාකාර විය. ඉඩම් ප්‍රශ්නය ඒ අතරින් ප්‍රධාන ස්ථානයක් හිමි කර ගනියි. අධිරාජ්‍යවාදීන් පැන වූ නීති රීති හේතු කොට ගෙන පාරම්පරික ඉඩකඩම් භුක්ති විඳි ජනතාවට එම ඉඩ කඩම් අහිමි විය. එයට ප්‍රතිකර්මයක් වසයෙන් නිදහස ලබන්නට ආසන්න යුගය වන විට ගොවිජනපද ව්‍යාපාරය පවතින රජයන් විසින් ආරම්භ කරන්නට යෙදුණි. මෙලෙස සංවර්ධනය වන බිම් කැබලි සාමාන්‍ය ජනයා විසින් හඳුන්වනු ලැබුවේ ''කොලනි'' ලෙස ය. මෙම ''කොලනි'' යන සිංහල වචනය ඉංග්‍රීසි භාෂාවෙහි එන "Colony" යන වචනයෙන් ගත්තක් වන අතර ගුණපාල මලලසේකරයන්ගේ ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂයෙහි ඒ සඳහා දක්වා ඇති නිර්වචන

අතරින් "විශේෂ ප්‍රදේශයක පදිංචි කරනු ලබන පිරිස" යන්න වචනය උචිත වන බවත් පෙනේ (1993:167). ලතින් භාෂාවෙහි Colonia යනුවෙන් ඒකවචන වශයෙන් ද coloniae යනුවෙන් බහුවචන ලෙස ද භාවිත වෙයි ( Encyclopedia of Britannia 2005).ජනපද යන වචනය ද සමානාර්ථවත් පදයක් ලෙස සිංහලයේ භාවිත කෙරේ.

ලාංකේය ගොවි ජනපද ව්‍යාපාරයට දශක හතරකට වඩා වැඩි ඉතිහාසයක් ඇත. එසේ ම ලාංකික මුළු ජනගහනයෙන් ලක්ෂ දහයක, සකළොවක පමණ ජනතාව මෙම ජනපදවල වාසය කරති. ශ්‍රී ලංකාවේ ගොවිජනපද ව්‍යාපාර අතරින් ගල්ඔය ව්‍යාපාරයට හා මහවැලි ව්‍යාපාරයට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ලංකාවේ ගොවි ජනපද පිහිටුවීම ක්‍රමවත් සහ වේගවත් වනුයේ 1935 ඉඩම් සංවර්ධන ආඥාපනත සම්මත වීමෙන් පසු ව ය (හෙට්ටිආරච්චි 1998:46).

මේ නව ඉඩම් හෙවත් ගොවිජනපද පිළිබඳ ව ප්‍රථමයෙන් ම නවකතාවක් පළ කරනු ලැබුවේ 1959 වර්ෂයේ දී මඩවල එස්. රත්නායකයන් විසිනි. එය දක්කර පහ නම් වූ අතර එයට එම වසරේ පළ වූ උසස් ම නවකතාවට හිමි වන දොන් පේද්‍රිස් ත්‍යාගය හිමි වූ අතර ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා අතින් එය සිනමා පටයක් බවට ද පත් විය. පනහේ දශකයේ සිට සිංහල නවකතාකරුවන්ගේ අවධානයට පාත්‍ර වූ මේ ගොවිජනපදයන්හි අභ්‍යන්තරික තතු සාහිත්‍යය ප්‍රවාහයට එක් ව ඇත්තේ දෙවන පාක්ෂිකරුවන්ගේ ඇසින් ගොවි ජනපද පිහිටුවා වසර තිස් ගණනකට පසු ව බව ද සඳහන් කළ යුතු ය. එවන් වූ තතු කුමන අයුරින් විදාරණය කොට ඇත් දැයි අනූව දශකය ඇසුරින් පරීක්ෂා කිරීම මෙහි මූලික අධ්‍යාශය විය.

කිසිදු බිම් අගලකට හිමිකම් නො කියූ ලංකාවෙහි විවිධ ප්‍රදේශයන්හි ජනතාව මේ නව ජනපදවල ජනපදිකත්වය ලැබූ අතර ඔවුන් විවිධ කුලවලට අයත් වූ, විවිධ වූ සිතුම් පැතුම් සහිත වූ, විවිධත්වයෙන් යුතු ජන කොට්ඨාසයක නියෝජනයක් විය. එබැවින් ජනපද සමාජයේ සමාජ රටාම

දිවයිනේ අන් ප්‍රදේශවලට වෙනස් වූ සුවිශේෂී ලක්ෂණවලින් සමන්විත වූවක් ද? එසේ ම සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන්ගෙන් මෙම නිර්මාණ කොතෙක් දුරට අගය කළ හැකි ද? යනු මෙහි මූලික පර්යේෂණ ගැටලු විය. ඒ සඳහා අනූව දශකයේ දී ලියැවුණු නවකතා හයක් සන්සන්දනාත්මක ලෙසින් විශ්ලේෂණයට හසුකොට ගත් අතර ජානපදික අභ්‍යන්තර තතු පිළිබඳ ව මානව විද්‍යාව, භූගෝල විද්‍යාව සහ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්හි ද කළ පර්යේෂණ මගින් ද වැදගත් තොරතුරු අනාවරණය වන බවත් සඳහන් කළ යුතු ය.

බොහෝ නවකතාකරුවන්ට සමාජයේ විවිධ පාර්ශවයන් විසින් විවිධ හැඩතලයන්ගෙන් යුත් වස්තු බීජ සපයා ඇති බව අද්‍යතන නවකතාව දෙස අවධානය යොමු කිරීමේ දී පසක් වේ. විචිත්‍ර වූ වස්තු විෂයන් කරා තම සියුම් විචාරක්ෂිය යොමු කර ඇති සිංහල නවකතාකරුවාගේ තවත් එක් අවධානය යොමු වූ අංශයක් වනුයේ ශ්‍රී ලාංකික ගොවිජනපද ව්‍යාපාරය යි.

අනූව දශකයෙහි ගොවිජනපද වස්තු විෂය කරගත් නවකතා කිහිපයක් ම ලියැ වී ඇත. ඒ අතරින් මෙම අධ්‍යයනයේ දී අවධානයට යොමු වන්නේ පහත දැක්වෙන කෘති හය පමණක් වන අතර ද්විතියික දත්ත විෂය කොට නො ගත් බව ද සඳහන් කළ යුතු ය.

i. පැලෑනෙන් වෙන් කළ ඉඩම් - විර පොකුණේ උපරතන හිමි (1990)
ii. නිම්නයක අඬහැරේ - පියසේන කහඳගමගේ (1991)
iii. අපට යන්න තැනක් නෑ - මහාචාර්ය තිස්ස කාරියවසම් (1998)
iv. වපසරිය - අනුලා විජයරත්න මැණිකේ (1999)
v. කටු ඉඹුල - සරත් ධර්මසිරි (1999)
vi. වරාමල් - ශාන්ති දිසානායක (1999)

## මුල් ජානපදිකයින් මුහුණ දුන් ගැටලු

ඉහත දැක් වූ නවකතා අතරින් බහුතරයක මෙම ජනපදවාසීන් ස්වභාවධර්මයෙහි විවිධ බලපෑම්වලට මෙන් ම විවිධ හැඩතලයන්ගෙන් යුක්ත වූ ප්‍රශ්නවලට අනවරතයෙන් ම මුහුණ පෑ අයුරු කියවේ. ඒ අතරින් මැලේරියා උවදුර, වනසතුන්ගේ උවදුරු, සනීපාරක්ෂක සේවාවන්හි පවතින ඌනතා, නිලධාරීන්ගේ වංචනික කටයුතු, ලිංගික ගැටලු, කුල ප්‍රශ්න යනා දි බොහෝ මානුෂික ගැටලු පිළිබඳ ව අවධානය යොමු වී ඇති අතර ම කොලනි වැසියන්ගේ ආකල්ප, දුක්ඛ දෝමනස්සයන් මෙන් ම ප්‍රාර්ථනා ද අන්තර්ගත වී ඇත. මෙම ජනපදවල ආභ්‍යන්තරික තතු ඉතාමත් හොඳින් විදාරණය කරන නවකතාවක් සේ විරපොකුණේ උපරතන හිමිගේ පැලෑනෙන් වෙන් කළ ඉඩම හඳුන්වා දිය හැකි ය. මෙහි බොහෝ අත්දැකීම් ඉදිරිපත් කරනුයේ මුදලිහාමි නැමැති චරිතය මගින් ය. කොලනි වැසියන් ස්වභාවධර්මයෙන් විඳි අනේකවිධ දුෂ්කරතාවන් එම චරිතය ඇසුරින් විග්‍රහ වී තිබේ.

''මුදලිහාමි පැදුරෙන් නැගිටලා ගිනි කබල ඇත් කළා. ලනු ඉණිමග බිමට පහත් කළේ ඊට පස්සේ. මුදලිහාමි බිමට පහත් වූයේ වටපිට බලමින්. කොයි පඳුරේ කොටිය ඉන්නව ද ............? එහෙම නැත්නම් වලහ ඉන්නව ............. ද? කියන්න කවුද දන්නේ ..................? ඊයේ රාත්තිරියෙත් වලහ ගිනි ගොඩ ළඟ ලැගල තියෙනවා. ඌ හැම තැන ම බෙටි දම්ලා. ගන්දස්කාරෙ බැහැ. මුදලිහාමි වලස් බෙටි අළුවලින් වහල දැම්මා. කළගෙඩිය පතුලෙ වතුර ටිකක් තියෙනව. ඒක ඇති දවල් කෑම ඩිංග උයා ගන්න. නැත්නම් වතුර කළයක් ගේන්න හැතැප්මක් එක හමාරක් පමණ යන්න ඕන ආණ්ඩුවේ වතුර ටැංකිය ළඟට. ඊයේ බවුසරේ ආවේ නැත්නම් ටැංකියත් හිඳිලා. බවුසරෙත් එක දවසක් වැඩ කළොත් දවස් තුනක් කැඩිලා. වතුරවල අගේ කියල නිම කරන්න බැහැ. රත්තරන් වාගේ...........මුදලිහාමි දිය කඩිත්ත ළඟට ගියා. ගස්වලින් වැටෙන කොළයි, වේළුණ අතුයි නිසා වතුර පල් වෙලා. කළු පාටයි. මදුරු පැටව් ඒ අතර නලියනවා........... මුත් තමයි

මැලේරියාව බෝ කරන්නෙ........ මුදලිහාමි වතුරවල ගුණාගුණ නො බලා මුහුණ සෝදා ගත්තා''(උපරතන හිමි 1990:4-5).

ප්‍රාණවත් භාෂා රීතියක් භාවිත කරමින් කතුවරයා මුල්කාලීන ජානපදිකයින් ස්වභාවධර්මයෙන් විඳි අනේකවිධ දුක් කම්කටොළු විග්‍රහ කර ඇත. ජානපදික ජීවිත වස්තු විෂය කර ගැනීමේ දී එම වැසියන් විඳි කරදර මුදලිහාමි නම් ගැමියාගේ චරිතය මගින් ඉදිරිපත් කොට තිබීම නවකතාවෙහි කලාත්මක අගය වර්ධනය කිරීමට සමත් වීමට සමගාමී ව වස්තු විෂයෙහි යථාර්ථවාදී බව ද ඔප් නැංවීමට සමත් වී ඇත.

සරත් ආරියරත්නගේ **හැත්තෑවේ කොලනියට** මෙන් ම **පලෑනෙන් වෙන් කළ ඉඩම්** නව කතාවට ද වස්තු විෂය වී ඇති ප්‍රදේශය වනුයේ පොළොන්නරු ප්‍රදේශය යි. කොලනි වැසියන්ගේ ජීවිතයන්හි සමාජ ආර්ථික තතු වඩාත් සජීවී ලෙස පාඨකයා වෙත ළං කරලීමට භික්ෂුවක වූ උපරතන හිමියන් සාමර්ථ්‍යයක් දක්වා ඇති බව පෙනේ. බොහෝ මුල් කාලීන ජානපදිකයින් ජීවත් විමේ අරගලයෙහි දී විඳි දුක්ඛ දෝමනස්සයන් මෙම නවකතාවලින් පිළිබිඹු වී ඇත. පියසේන කහඳගමගේ නම් නවකතාකරුවාගේ **නිම්නයක අඩහැරේහි** දී අපට කිරිබණ්ඩා නමැති පුද්ගල චරිතය මගින් මෙම දුෂ්කරතා හඳුනාගත හැකි ය.

ගල්ඔය ව්‍යාපාරයේ මුලින් ම පදිංචි වූ ජානපදිකයින් මුහුණු පෑ දුෂ්කරතා කිරිබණ්ඩා හා ඔහුගේ පවුලේ සාමාජිකයින් ඇසුරින් මෙහි දී සාකච්ඡා කෙරේ. ගල්ඔය ව්‍යාපාරයේ ආරම්භයේ සිට එනම් 1950 වර්ෂයේ සිට 1970 කාල වකවානුව දක්වා මෙම නව කතාව දිග හැරේ. කිරිබණ්ඩා කොළඹ බලා පිටත් වන්නේ රැඳවුම් කඳවුරක රඳවා සිටින තම පුතු වන ගුණදාස බැහැ දැකීම සඳහා ය. දුම්රියේ දී ඔහුට හමුවන පාසැල් ගුරුවරයා සමඟ ඔහු කතා බහක යෙදේ. සිය පුත්‍රයා පිළිබඳ ව කිරිබණ්ඩාගේ සිතෙහි ඇතිවන සන්තාපය මග හරවනු සඳහා ඔහු අතීත ගොවි ජනපදයෙහි විස්තර ඇසීමට රුචිකත්වයක් දක්ව යි. එතැන් සිට බණ්ඩාගේ අතීත ආවර්ජනයක් ලෙසින් ඔවුන් මුලින් ම

ජනපදයේ පදිංචි වූ කාලයේ සිට වර්තමානය නෙක් නවකතාව දිග හැරෙයි.

මෙම නවකතාවෙහි, වස්තු වින්‍යාසය ගොඩනංවා තිබෙන අයුරු ද යම් අපූර්වතාවකින් යුතු බව පෙනේ. බණ්ඩාගේ අතීත ආවර්ජනයක් ලෙසින් වත්මන තෙක් නවකතාව විකාශනය වීම නවකතාවෙහි කලාත්මක අගය කෙරෙහි දායකත්වය සපයා ඇත.

"මහත්තයට පුදුම හිතෙයි රොටි පෙත්තක් නැත්නන් මයියොක්කා කොළයි බතුයි කාල තමයි අපි කඳු කපා ඇදලා කුඹුරු හැදුවේ. ලැබිච්ච කුඹුරුවල අලි ලගින වළවල් තිබුණ. අලියා බෝග කාලා විනාස කොළා. උන් එක්ක හපන් කොරල තමයි ඒව බේර ගත්තෙ. අඩිය තියන්න බයයි හැම තැන ම සර්පයො. නිලධාරිගොල්ලො අපිට සැලකුවෙ සතුන්ට වගෙයි. ඕව විඳගෙන අවුරුදු 20 ක් මේකෙ පීවත් වුණා. දැන් මොනවද මහත්තයෝ තියෙන අමාරුකම් ? මහත්තයට අහන් ඉන්න පුළුවනි නම් මං හෙට උදේ වෙනකල් කතාව කියන්නම්"(කහඳගමගෙ 1991:20).

ජානපදිකයින්ට හිමි වූ ඉඩම් වගා කිරීම සඳහා සුදුසු තත්ත්වයට ගැනීමට බොහෝ සේ ශ්‍රමය වැගිරීමට ඔවුනට සිදු විය. නිසියාකාර ජල පහසුකම් ආහාර යනාදිය නොමැති ව මුල් කාලීන ජානපදිකයින් අතිශය දුක්බර දිවිපෙවෙතක් ගත කළ බව බෝහෝ නවකතා මගින් හෙළි වේ. සියාතු. කිරිබණ්ඩා අමතා කරන ප්‍රකාශ ඒ සඳහා උපයෝගී කර ගත හැකි ය.

"කිරිබණ්ඩෙ, උඹට නම් කුඹුර කපල ඇදල ලියදි හදල ඉවර කරන්න අවුරුදු හත අටක් යාවි. අලි ලගින වළවල්නෙ තියෙන්නේ සියාතු කීවේ විශාල වලක් පෙන්වමින් ය. කිරිබණ්ඩෙට විතරක් නෙවි වැඩි හරියකට ම අවුරුදු හත අටක් විතරම කපා අදින්න වේවි. මේවා කුඹුරු බවට පත් වෙන කොට අපේ හොඳ පණ ගිහිල්ල කාගෙදෝ කප හඬ! ඇසිණි"(කහඳගමගේ 1991:31).

ක්‍රමයෙන් මිනිස් පහස ලැබීමෙන් වනාන්තර පෙදෙස් එළි පෙහෙළි වන අන්දමත් වියලි කලාපයේ මිනිසුන් ස්වාභාවික පරිසරය සමග අරගලය කරමින් ජීවිතය ගෙන යාමට දරන අප්‍රතිහත ධෛර්යයත් අනුලා විජයරත්න මැණිකේගේ වපසරිය නවකතාව මගින් ද ධ්වනිත වේ. මෙහි දී මින්නේරි ගොවිජනපද ව්‍යාපාරය පසුබිම් කොට ගෙන ඇත.

''........ කටු ඉඳි පඳුරින් ද කටු රූන් සහිත වේගාලින් ද පිපි මල් බරවුණු කොරොස් කටු සහිත නාපිරිත්ත වැලින් ද ගෙවුණු වන ලැහැබේ මින්සුන්ට ඉඩ දී ටිකෙන් ටික පස්සෙන් පස්සට යන්ට පටන් ගෙන තිබේ. මිනිස් පියවර ලකුණු කළ පෙත් මං නොඉඳුල් වන දහන තුළට පිවිසෙයි. අතරින් පතර සාමඩුලු විහිදුවා වැඩුණු සුවිසල් වනස්පතීන් යට කටු සහිත පඳුරුත්, වැලුත් සුවසේ වැඩුණු කාලය ගෙවී යන බව හැම අතින් ම පෙනෙන්ට වෙයි. දම්පාට මල් එක යායට පිපී තිබෙන ගිරිතිල්ල වැලුත්, දුඹුරුපාට කෙමියක් සහිත ව කහ පාටින් පිපිණු කොරොස් කටු සහිත නාපිරිත්ත වැලුත් ඇති දමන බිම් කඩවල් ද ගොඩ ගොවිතැන් සඳහා එළිවෙයි. මිනිසුන් පදිංචි වූ බිම්කඩ අතුරින් නොසිඳින ලද වන ලැහැබක් ඇත්තේ කලවැල් යටින් යන කල හා දිය බැස යන කල බුබුළ අවට මානයේ අක්කර දෙක තුනක පමණි''(විජයරත්නමැණිකේ 1999:25).

ජනාවාස අලුතින් ආරම්භ වීමෙන් පසු ක්‍රම ක්‍රමයෙන් කැලෑ පෙදෙස් ජනාකීර්ණ වන අයුරු අපූරු ගැමි භාෂාවක් මගින් කාව්‍යාත්මක ව හෙළි කිරීමට ලේඛිකාව දක්වන සාමර්ථ්‍යය මෙම නිර්මාණයෙහි කලාත්මක පාර්ශවය දියුණු කරවන සාධකයකි. මුල්කාලීන ජානපදික තොරතුරු පමණක් නො ව ක්‍රම ක්‍රමයෙන් ජානපදික ජීවිතය සංකීර්ණ වන අයුරු ද කතා වින්‍යාසයට බාධා නො වන අයුරින් හා අත්දැකීමට උචිත අයුරින් ද වපසරියෙහි අන්තර්ගත ය. ඉන්දියාවෙහි ගාන්ධි ප්‍රමුඛ නිදහස් සටන් ව්‍යාපාරය පිළිබඳ ව ද 1940 ගණන්වල දී ලංකාවෙහි පැවැති යුධමය වාතාවරණය ද වගා සංග්‍රාමය පිළිබඳ තොතුරු ද යනාදි ලෙස සමකාලීන යුගයේ දේශපාලනික ආර්ථික හා සාමාජික තොරතුරු ද මෙහි අන්තර්ගත ය.

වරුණසේන හා විවාහ වූ සුපිනවතී පදිංචිය සඳහා පැමිණෙනුයේ මින්නේරි ගොවිජනපද ව්‍යාපාරයට ය. නව ජනපදයෙහි ආහාර දුෂ්කරතාවන්ට ඇයට සාර්ථක ලෙස මුහුණ පෑමට උපදෙස් දෙන්නී ඔළිඳහාමි ය. වියළි කලාපීය ජන ජීවන රටාව කෙතරම් දුෂ්කර ද යන්න මෙම නවකතාව හරහා පාඨකයාට හඳුනාගත හැකි ය.

"කරල් පිටින් එල්ලා වියලන ලද බඩ ඉරිඟුවලින් සාදන එක ම කෑම බීජ බැද, කොටා, පොලුත් සීනිත් දමා ගුලිකොට ගන්නා ලද අතුරුපස යැයි සිතා සිටි ඇට ඉරිඟු බීජ පොගවා වනයෙහි ලා කොටා රසැති ඉරිඟු පිට්ටුත්, බතුත් සාදා ගන්නා සැටි කියා දුන්නී ඔළිඳහාමි ය. කුරක්කන් පිට්වලින් කටෙහි නෑලෙන පදමට තළපය හැදි ගාන්ටත්, කැඳ පිසින්ටත් ඈ නොපමාව උගත්තාය.

මේ රටේ දෙවේල බත් කන්නේ නෑ නෝනො, පුළුවන් කොමකුත් නැහැ, ඔළිඳහාමි කීවා ය"(විජයරත්න මැණිකේ 1999:30).

වපසරිය නවකථාව සඳහා ලාංකේය සමාජයේ 1930 දශකයෙහි සහ 40 දශකයෙහි තොරතුරු ද අන්තර්ගත වී ඇත. ඩී.එස්. සේනානායක වැනි පුද්ගලයින් විසින් ආරම්භ කරන්නට යෙදුණු ගොවිජනපද ව්‍යාපාර වටා බැඳුණු අත්දැකීම් සමුදායක් මෙන් ම මෙම වැසියන් මුහුණ දෙන ජීවන ගැටලු ද සමකාලීන යුගයේ බොහෝ දේශපාලනික, ආර්ථික හා සමාජීය ගැටලු ද පිළිබඳ ව කතුවරිය අවධානය යොමු කොට ඇත. ඉඩම් අහිමි ජනතාව මෙම නව ජනපද ව්‍යාපාර හේතු කොට ගෙන නව ජීවනයක් ලැබූ බව බොහෝ දුරට වටහා ගත හැකි ය.

මහාචාර්ය තිස්ස කාරියවසම් විසින් රචිත අපට යන්න තැනක් නෑ වුල්ල නවකථාව මගින් ද ලුණුගම් වෙහෙර ජනපද ව්‍යාපාර යටතේ ඉඩම් ලබා එහි ජානපදිකත්වය ලැබූ සූමනදාස නම් ප්‍රධාන චරිතය ලවා ඔවුන්ගේ ජීවිතයෙහි ඇති

ගැටලු පිළිබඳ ව කියවේ. ගිං ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය හේතු කොට ගෙන ඔවුන් වාසය කළ පාරම්පරික ඉඩම්කඩම් අහිමි වීම හේතු කොට ගෙන ලුණුගම් වෙහෙර ව්‍යාපාරය වෙත මෙම ජන කොටස යොමු කරවන ලදහ. ඔවුන්ගේ ජීවිතයෙහි අතිමානුෂීය පාර්ශවයක් වෙත කතුවරයා අන්කතුවරුන්ට විෂය නො වූ දෘෂ්ටියක් හෙළා ඇතැයි කිව හැකි ය.

මුල්කාලීන අනිකුත් ජානපදිකයින්ට මෙන් ම මොවුන් මුහුණ දුන් ප්‍රබලතම ප්‍රශ්නයක් වූයේ ජල ප්‍රශ්නය ය.

''ගොඩ ඉඩම පෙන්නූ නිලධාරියා ම අප කැඳවාගෙන කුඹුරු පෙන්වන්නට ද ගියේ ය. ගමේ දිගනේ හා වතුරාවේ තියෙන අල්ලක් විතර කුඹුරු දෙක තුන දිහා බලා මේ කුඹුරු දිහා බැලුවා ම මහා රාජ්‍යයක් ඇල්ලුවා වාගේය. එහෙත් ගමේ කුඹුරුත් මේ කුඹුරුත් අතර වෙනසක් තිබේ. මේවා කුඹුරු නොව ඕවිටිය. වතුර බිංදුවක්වත් ගැවුණු බවක්වත් පේන්ට නැත. මේවා කුඹුරු වන්නේ කෙසේද ? වේලි, නියරවල්, ඇළවල්, වක්කඩවල්, එකක්වත් මේ හතර මායිමක නැත. මේවා කුඹුරු යැයි කියූවත් ගොඩ ඉඩමට වඩා වෙනසක් පේන්නට නැත. මේවා කුඹුරු කරන්නේ කෙසේද ?''(කාරියවසම් 1998:77).

ජනපද ජීවිත වස්තු විෂය කර ගනිමින් ලියැවුණු අන් සියලු ම නවකථා අභිබවා ජානපදිකයින්ගේ ජීවිතයන්හි සජීප රූපයක් ප්‍රාණවත්, කටවහරට හුරු භාෂා රීතියක් මගින් ගෙන එනු ලබන්නේ **පැලෑනෙන් වෙන් කළ ඉඩම්** නවකථාව මගින් යැයි කිව හැකි ය. ස්වාභාවික ආපදා, වගවලස් උවදුරු, මැලේරියා උවදුරු, ලිංගික ගැටලු යනාදි දහසකුත් මානුෂික ගැටලු කතුවරයා පාඨකයා හමුවට ගෙන එයි.

නව ජනපදවල වැසියන්ට බල පෑ ප්‍රශ්න පිළිබඳ ව සාකච්ඡා කිරීමට පැමිණි සේනාරත්න මහතා (සහකාර දිසාපති) අහිංසක ගොවින්ගේ දුක, වේදනාව හඳුනන කාරුණික අයෙක් විය. ඔහු හමුවේ ජානපදිකයන් ඉදිරිපත් කළ ප්‍රශ්න

නවජනපද වාසීන්ගේ දිවි පෙවතෙහි සමාජ ආර්ථික පැතිකඩ දෙස හෙළන ලද සියුම් දෘෂ්ටියකි.

සෑම සත්ත්ව කොට්ඨාසයකට ම පොදු වූ තත්ත්වයකි ලිංගික උවමනා එපා කම් පිරිමසා ගැනීම. මුදලිහාමි වැනි තරුණ ගොවීන්ටත් එය පොදු වූ තත්ත්වයකි. ජනපදය සඳහා ලැබුණු ඉඩම්, තම භාර්යාවන්, දූ දරුවන් සමග පදිංචියට සුදුසු තත්ත්වයට පත් කරවන තුරු මොවුන්ගේ කායික අවශ්‍යතා ඉටු කර ගත් අන්දම ජීවිත පරිඥානයෙන් යුතු ව උපරතන හිමියන් දක්වා ඇතැයි කිව හැකි ය. තවමත් ගම සිටින තම භාර්යාවන් නිරන්තරයෙන් මොවුන්ට සිහිපත් වූ අයුරුත්, ගණිකාවන් වෙත පවා යමින් තම කායික අවශ්‍යතා ඉටුකරගත් අයුරුත් මුදලිහාමිගේ චරිතය මගින් විද්‍යමාන ය.

''.........හිගුරක්ගොඩ ඉස්ටේසම ළඟයි ඇළ මාර්ගය දිගටම්යි පෙට්ටි කඩ තියෙනව. මේ පෙට්ටි කඩවල ඉන්නේ ගැහැනු පමණයි. මේසයක් මත සීනිබෝල බෝතලයක් හමාරක් ... විට ... බීඩි තියෙනව. කඩේ එපමණයි. බවලත් ඇත්තො කවුන්ටරය ළඟ වාඩි වෙලා ඉන්නවා. මිනිස්සු ගිහින් විට කනව, බීඩි බොනව, කථා බහ කරනව, ඊට පස්සෙ රුපියල් පහ දහය ගානෙ කාන්තාවන්ට දීල එනව. ජානපදිකයන් අතර බොහොමදෙනෙක් රෝස අක්කා, රතු අක්කා, කළු නංගි ගැන දන්නව. මුදලිහාමි ගිය කඩේ උන්නෙ රෝස අක්ක ද රතු අක්ක ද කළු නංගි ද කියන්න මිනිහවත් දන්නෙ නැහැ'' (උපරතන හිමි 1990:54).

කතුවරයා ජීවිතයෙන් ලද හික්මීම ද මානව ජීවිත විවරණයක් ද ඉතාමත් ම කලාත්මක ව හෙළි වන අවස්ථාවක් සේ මෙම අවස්ථාව දැක්විය හැකි ය. මුදලිහාමිගේ චරිතයෙහි සංකීර්ණ ස්වභාවය සේ ම කතුවරයා යම් යම් සිද්ධි හා අවස්ථා ඉදිරිපත් කිරීමෙහි ලා දක්වන විවේක බුද්ධිය හා සංයමය ද මෙම නවකථාවට ලබා දී ඇත්තේ ප්‍රබල ආලෝකයකි.

සරත් ධර්මසිරිගේ කටු ඉඹුල නවකතාවෙහි ද අඟර දඟරකාරියක වූ ලැන්ටිස්ගේ බිරිඳ කරා ළංවීමට බොහෝ දෙනා උත්සාහ කළහ. ඇතැම් ජනපද නිලධාරීහු පවා

ඇයගෙන් ලිංගික අවශ්‍යතා ඉටු කර ගැනීමට නො පසුබට වූහ. ක්‍රමයෙන් ජනපදයන්හි සාරධර්ම පිරිහී යාමට ද මෙවැනි කාරණා බලපාන්නට ඇතැයි සිතිය හැකි ය.

## අතරමැදියන් විසින් ශ්‍රමය සූරාකෑම

ගොවිජනපදවාසීන්ගේ ජීවිත විවිධ දෘෂ්ටිකෝණ ඔස්සේ විමර්ශනයට ලක් කළ නවකතා හයක් පමණ මෙහි දී අවධානයට යොමු වූ අතර ඉන් බහුතරයක ම පාහේ ඔවුන්ගේ ශ්‍රමය අතරමැදි පිරිස් විසින් අසාධාරණ ලෙස ලබා ගැනීමේ සිද්ධි අන්තර්ගත වී තිබුණි. මහ පොළොව සමඟ දැඩි සේ පොර බැඳීමෙන් අනතුරු ව ඔවුන් ලැබූ අස්වැන්න බොහෝවිට මුස්ලිම් වෙළඳුන්ට සහ වෙනත් අතරමැදි පිරිස් අතර ධන උල්පත් බවට පත්විය. මෙම ජනපදවාසීන් මුහුණ දුන් තවත් එක් ප්‍රධාන බේදවාචකයක් ලෙස මේ තත්ත්වය හඳුන්වා දිය හැකි ය.

ගොවීන් අස්වනු නෙලා ගැනීමටත් ප්‍රථම ඔවුන් සූරා කන වෙළඳ පැලැන්තියක් ඉතා සියුම් ලෙස හිස ඔසවනු දක්නට ලැබීම ජනපද ජීවිත දෙස අවධානය යොමු කිරීමේ දී ප්‍රත්‍යක්ෂ වේ. ඉතාමත් සංවිධානාත්මක ලෙස ඔවුන් කටයුතු කළ අයුරු වටහා ගැනීම එතරම් දුෂ්කර නො වනු ඇත. **පැලෑතෙන් වෙන් කළ ඉඩම්හි ද මුදලිහාමි සෝකයෙන්** සිහිකරලනුයේ ගොවියාට සිදුවන අසාධාරණකම් ය.

''කොයි තරම් සාරෙට හැදුනත් පලක් තියේයෑ. ඒව මිලයට ගන්න ඇත්තො කරන්නෙ ම බොරුව. වී වලට සහතික මිලක් නැහැ. වෙළෙන්දො ඉල්ලන ගානට බෝග ජාති අලෙවි කරන්න ඕනි. එහෙම බැලුවම අහසෙන්, පොළවෙන් කොයි තරම් උදව්වක් ලැබුණත් ගොවියන්ට වෙළෙන්දන්ගෙන් සෙතක් නැහැ. ගොවියන්ට ලැබෙන්නෙ සුළු මුදලයි. මුදලාලිලා හීල් හෙවනෙ ඉඳල ජානපදිකයින්ගෙ සාරය උරා බොනවා. එහෙත් අව්ව, අව්වෙන් කෙරෙන්නෙත් සාරය උරා බොන එකමයි. සොබාව දරුමෙත් ගොවියන්ට එරෙහි වෙලා ''(උපරතන හිමි 1990:93).

මට්ටයින් නමින් ද මරක්කලයින් නමින් ද හැඳින්වෙනුයේ මුස්ලිම් ජාතික වෙළෙන්දන් ය. ජානපදිකයින්ගේ අස්වනු මෙම වෙළෙන්දන් සේ ම වෙනත් අතරමැදියන් ද සූරා කෑහ. නිම්නයක අඬහැරේ දී හමු වන මැනේජර් මහතා නම් පුද්ගලයා උපක්‍රමශීලී ව ජානපදිකයින් සූරා කෑමෙහි යෙදුණු අයෙකි. කොලනි ජනපදයන්හි ධනවත් පැලැන්තියක් බිහි වීමේ මූලික අඩිතාලම මෙම කරුණු ඇසුරින් සාක්ෂාත් කර ගත හැකි ය.

''එම කන්නයේ ජනපදයේ වී වැඩි ම ප්‍රමාණයක් ආවේ මැනේජර් මහත්තයාගේ කඩයටය. රුපියල් අට ගණනේ මුදල එවෙලේ ම ලබා ගැනීම ලාභයකැයි ගැමියෝ කල්පනා කළහ. රේඩියෝ, බයිසිකල්, රෙදිපිළි ආදී විවිධ බඩු මැනේජර් මහත්තයාගේ කඩේ ගොඩ ගැසී තිබිණි. වී දී ලබාගත් මුදල් කඩේට ම දී තමන් කැමති බඩු ගෙනයාමට ජානපදිකයින්ට අවස්ථාව ලැබිණි. රේඩියෝ විස්සක් පමණ ද බයිසිකල් තිහක් පමණ ද අලෙවි වී ඇතැයි යන ආරංචිය පැතිරිණි''(කහඳගමගේ 1991:81).
ඉස්කෝලෙ මහතා පවසන වදන්වලින් ද ඉහත දැක් වූ කරුණ වඩාත් සනාථ වේ.

''ඒ මිනිහා කොලනිය ම රවට්ට ගත්තා. බෝඩ් එකට දුන්නනම් ණය මුදලත් කැපිල ඔයිට වඩා ගාණක් අතට හම්බ වෙන්න තිබුණ. කොලනියෙ වී වලින් මිනිහ ගත්ත මරික්කලේ වාසියම ඇති ට්‍රැක්ටරයක් ගන්න. වී ටික කඩේට එන කොට කඩේ බඩු පුරවලා. වයිවාරන්න බඩු දැක්ක ම මිනිසුන්ට බලන් ඉන්න බෑ. වී වික්ක සල්ලි එතෙන්ට ම දීල බඩු අරන් යනවා. රුපියල් එකසිය පනහෙ රේඩියෝව දෙසීය ගානෙ වික්ක. කොහොම කොහොම හරි කොලනියෙ ම සාරෙ මිනිහ ඇද ගත්තා. ඔන්න ට්‍රැක්ටරේකුයි, ලොරියකුයි ගන්න මේ පාරම බ්‍රවුන් සමාගමට මුදලුත් බැන්දලු. කොලනිකාරයින්ගෙ අහිංසක කමින් ඒ මිනිහ ප්‍රයෝජන ගත්ත''(කහඳගමගේ 1991:81-82).

වපසරිය නවකතාවෙහි ද ගොවියාට සිදුවන මෙවැනි අසාධාරණකම් පිළිබඳ ව තොරතුරු අන්තර්ගත ය.

''මෙදා පාර අනුරාජපුරේ මෝල ගන්නවලු බුසල එකයි විසි පහට, දැන්විම් අලෝල තියෙන්නෙ. මරක්කලයො සත හැත්තෑපහට මැන ගෙන ගියැං පස්සෙ තමයි මතක්කුණේ, එයි අප්පු කීවේ කෝපයෙනි.
සමූපකාරෙං ණය අරන් ඒව කපයි කියල බයට මරක්කයින්ට වී මැන්නා. මෝඩ යක්කු, මැන්ඩිස් කීවේ ය''(විජයරත්න මැණිකේ 1999: 54).

## ජනපද නිලධාරී ක්‍රියා පටිපාටිය

අභිනවයෙන් ඉදි කරනු ලැබූ ගොවිජනපද ව්‍යාපාරයන්හි කටයුතු අධීක්ෂණය කිරීම සඳහා නව නිලධාරී පැලැන්තියක් පවතින රජයන් විසින් පත් කරන්නට යෙදුණහ.

ඔවුන්ගේ රාජකාරි අතර ප්‍රමුඛස්ථානයක් හිමි වූයේ නිසි පරිදි ගොවීන්ගේ අවශ්‍යතා, අඩුපාඩු සොයා බලා කටයුතු කිරීම ය. එහෙත් ජනපද පිහිටු වීමෙහි මෙම අභිලාෂයන් අදාළ නිලධාරීන්ගෙන් ඉටු නො වුණු බව බොහෝ නවකතා මගින් හඳුනා ගත හැකි ය. අවංක නිලධාරීන් ද කලාතුරකින් නො සිටියා නො වේ. ඒ අතරින් කැපී පෙනෙන සේවයට කැප වුණු, අවංක නිලධාරියෙකු ලෙස පැලෑනෙත් වෙත් කළ ඉඩම්හි සහකාර උපදිසාපති සේනාරත්න මහතා ව හඳුන්වා දිය හැකි ය. නමුත් කොලනිවල තත්ත්වය බොහෝ දුරට දුර්වල වීමට වංක නිලධාරී පැලැන්තියේ ක්‍රියාකලාපයන් බෙහෙවින් ම ඉවහල් විය. අසරණ ගොවීන් තවත් අසරණ කිරීමට මොවුන්ගේ ක්‍රියා පටිපාටිය අත්‍යන්තයෙන් ම හේතු විය. එක් ජනපදයක් බාර නිලධාරියා ජනපද වාසීන් වී.ඕ. මහතා **(Village officer )** ලෙස හැඳින් වූ අතර ජනපද කිහිපයක් බාර ව සිටින නිලධාරියා සී.ඕ. මහතා **(Colony officer)** ලෙස හඳුන්වනු ලැබිණි.

සෑම ගොවිජනපදයක ම පාහේ නිලධාරී පැලැන්තිය ගොවීන්ට ලැබිය යුතු සහනාධාර යටි මඩි ගසා ගත්හ. මුදලිහාමිගේ ආවර්ජනා ඔස්සේ මෙම තත්ත්වය වටහා ගත හැකි ය.

''..... එහෙම නැත්නම් හැමදාමත් කන්ඩ වෙන්නෙ බතුයි. පරිප්පුයි, කරවලයි, ඒව කාල දැන් අප්පිරිය වෙලා. කරපල කෑලිවලට වඩා තියෙන්නෙ කරවල කුඩු. ගන්දස්කාරෙ බැහැ. කරවල වෑංජනය ළඟට නොවැරදි නිල මැස්සොත් එනව. ආණ්ඩුවෙන් දෙන හොඳ කරවල නිලධාරීන් ගහ ගන්නවලු. පෝරවලට තිකුත් කරන කරවල මිනිසුන්ට කන්ඩ දෙනව. ඕව කීවට බැහැ. නඩුත් හාමුදුරුවන්ගෙ බඩුත් හැමුදුරුවන්ගෙ''(උපරතන හිමි 1990:21).

ජනපද නිලධාරීහු ද අල්ලස හා දූෂණයට අනුබල දුන් පිරිසක් වූහ. මෙවැන්නන්ගේ ක්‍රියා කලාපයන් ''කටු ඉඹුල'' නවකතාවෙහි බොහෝ අවස්ථාවල දී දෘශ්‍යමාන ය. මෙහි ''සේතුංගා'' නැමැති පුද්ගලයා අත්හැර දමනු ලැබූ ඉඩම් කොටසක් වෙනුවෙන් සී.ඕ. මහතාට මුදල් හා රණා නැමැති ව්‍යාපාරිකයාට අරක්කු හා සිගරැට් අල්ලස් වසයෙන් පිරිනමයි. එසේ ම සුගතබණ්ඩා හා සිකුරාජපති වැනි පුද්ගලයන් අක්කර විශාල ප්‍රමාණයක් සඳහා හිමිකම් කියනු ලබන්නේ ජනපද නිලධාරීන්ගේ මිත්‍රත්වය හේතු කොට ගෙන ය. ඉඩම් සම්බන්ධ ව තිසි අයිතිය පෙන්වීමට නො හැකි අහිංසක ජනතාව මුලා කරමින්, ව්‍යාජ ලිපි ලේඛන ඉදිරිපත් කරමින් මෙවැනි පිරිස් නිලධාරීන්ගේ ද සහාය ලබාගෙන අහිංසකයින් අසරණ කළ අන්දම ද අන්තනෝමතික නිලධාරී පැලැන්තියේ ඒකාධිපති පාලනය පිළිබඳ තොරතුරු ද මෙම නවකතා ව මගින් විග්‍රහ කෙරී ඇත. එක් අතෙකින් සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයන්ගෙන් මෙම නවකතා විමර්ශනය කළ හැකි වන්නේ මෙවැනි කරුණු හේතුවෙනි. සිකුරාජපති. කපුරුබණ්ඩා නැමැති පුද්ගලයාගේ වෙඩි පහරින් මරුමුවට පත් වන්නේ ව්‍යාජ ලෙස චූටා නැමැති පුද්ගලයාගේ ඉඩමේ තම හිමිකාරත්වය ඔප්පු කිරීමට යෑමේ ප්‍රතිඵලයක් වසයෙනි. කටු ඉඹුල නවකතාවෙහි ජේම්ස් රාජාංගනයට පැමිණෙනුයේ ඔහුට වගා කිරීමට බිම් අඟලක් හෝ නො තිබූ බැවිනි. ඔහු මහත් වැර වෑයමෙන් ජීවිතය ගොඩ නගා ගන්නට උත්සාහ දැරූ ධෛර්යවන්තයෙකි. ඔහුගේ පුතු වූ සේකර විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෙකි. ජනපද නිලධාරීන්ගේ අයුතු ක්‍රියා දෙස බුද්ධිමත් ව සිතිමට ඔහු විවිධ අවස්ථාවල දී

උත්සාහ දරනු පෙනේ. ඔහුට මුතුගල මහතා පවසන වදන්හි ගැබ් ව ඇත්තේ ජනපද ජීවිතයෙහි ආභ්‍යන්තරික තතු ය.

''දැං ඉඩම් ටික සුගතබණ්ඩා ගාව නැත්නම් වීරසිංහ ගාව ඉඩම් අවශ්‍ය අහිංසක මිනිස්සු ආයෙත් ආපහු ගියා. මේ ගැන නීතියක් නැහැ. නිලධාරීන්ටයි සල්ලිකාරයින්ටයි කැමති විදිහට ..... අහිංසක මිනිස්සු අතරමං වෙනව. ඊට පස්සෙ ගැණෙන තීරණ හරි භයානකයි. ඒකනෙ සිකුරාජපතිට වුණේ ''(ධර්මසිරි 1999 : 145).

## කොලනිවාසීන්ට හිමි සාමාජීය තත්ත්වය

නව ගොවි ජනපද ව්‍යාපාරයන්හි ජානපදිකත්වය ලැබුවෝ විවිධ ආගම්වලට අයත් විවිධ කුලයන්ට අයත් ලංකාවෙහි විවිධ පළාත් නියෝජනය කරන්නෝ ය. සාම්ප්‍රදායික සමාජය ඔවුන් ව හඳුන්වනු ලැබුවේ ,කොලනිකාරයන්, ලෙස අවඥාසහගත ව බව කිව හැකි ය. කටු ඉඹුලෙහි සුගතබණ්ඩා යම් ධනයකට උරුමකම් කී රාජාංගණයෙහි ඉඩම් ලබා පැමිණි ජානපදිකයෙකි. ඔහු රන්බණ්ඩා නිලමේගේ දියණිය වූ කොයිංමැණිකා විවාහ කර ගැනීම සඳහා අදහස් කරන බව දැන්වීමට ජේම්ස් නම් තම මිතුරා යවයි. එම විවාහ යෝජනාව අසන අවස්ථාවේ දී රන්බණ්ඩාගේ අදහස් විමර්ශනය කර බැලීමෙන් සාම්ප්‍රදායික ගැමි ආකල්ප විද්‍යමාන වේ.

''සුගතබණ්ඩ කියන ගැටය මාත් දන්නව. හේන්වලට යනකොට අපි උගෙන් බඩුත් අරං තියෙනව. ඒත් ජේම්ස් කොලනිකාරය කොලනිකාරයමයි. හොඳ එකෙක් කොලනියට එන්නෙ නෑ. හතර කේන්දරේ පාළුවෙච්ච එවුන් තමයි කොලනියට එන්නෙ. ඒ වුනාට අපි ඉන්නෙ පරම්පරා ඉඩංඔල. අපේ ඉඩං උඹලැ ඉඩං අස්සෙ තිබුණට එව්ව කොලනි ඉඩං නෙමෙයි. ඔව්ව ඉඩංද ජේම්ස් ? වැවේ වතුර තියෙනකං හොඳයි. ඊට පස්සෙ කන්නෙකට වී ටිකක් ගන්ට කාසි මුදල් තිබුණ ම ඕක කජ්ජක් යැ. වත්තියෙ ගෙවල්වල ගෑනු ගන්ඩ බැහැ එහෙම. අවුරුදු ගාණක් පැව්වත් දෙයියංගෙ පිහිටෙන් කන්ඩ කෑම අපේ අටු වල තියෙනව. ඒ

වුණාට එක පැවිල්ලෙන් කොලනිය ම ඉවරයි"(ධර්මසිරි 1999:92).

බුද්ධිමය නිම්වළලු පුළුල් කරන ස්ථානය ලෙස හඳුන්වන සරසවියෙහි දී පවා කොලණිකාරියක වීම හේතු කොට ගෙන සුබද්‍රා විවිධ අපහසුතාවලට මුහුණ පෑවා ය. සාම්ප්‍රදායික ගති සිරිත් හා ආකල්පවලින් එවන් බුද්ධිමත් කේන්ද්‍රස්ථාන පවා අපවිත්‍ර ව පවතින අයුරු කතුවරයා හෙළි කරන්නේ ලාංකික ජනතා අධ්‍යාත්මය ද හෙළි කරලමිනි.

"එහෙම නම් විශ්වවිද්‍යාලයෙහි සමහර ශිෂ්‍යාවෝ තමා හැඳින්වීමට කොලනි යන විශේෂණය යොදුවෙ ඇයි ?..... ඇයි උන් 'නුවර සුබද්‍රා' එහෙම නැත්නම් 'පොළොන්නරුවෙ සුබද්‍රා' කියලා තමා හැඳින්නුවෙ නැත්තෙ ?.... උන් මට 'කොලණි සුබද්‍රා' කිවෙ අපහාසෙට.... අනෝමා නිදි කිරනවා. ඇය කොළණි කෙල්ලක්. නමුත් අනෝම මිනිස් හැඟීම් මරා නැහැ. දැනට සුබද්‍රාගේ ප්‍රියතම සමීප යෙහෙළිය අනෝමයි. ඇය ඉගෙන ගෙන ඇත්තේ පස්වන කැලෑසිය දක්වා පමණයි. සමහර විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන්ට වඩා මිනිස් ගුණ අතින් අනෝම උන්නෙ බොහොම ඉදිරියෙන්"(උපරතන හිමි 1990:174-175).

තිලධාරි පැලැන්තිය පවා කොලනිවාසින් පහත් ජන කොටසක් සේ සලකා ක්‍රියා කළ අන්දම ද මෙම නවකතාවෙන් මගින් විග්‍රහයට ලක් කෙරී ඇත. යන්ඩ එන්ඩ තැනක් නොමැති අභිකුණ්ඨික රළක් සේ මෙම ජනතාව වෙත හෙළන ලද්දේ අවඥාසහගත දෘෂ්ටියකි. කොලනි ජනපදවල අභ්‍යන්තර ජීවන තතු ඉතා යථාර්ථවාදි ව ගෙන හැර දැක් වූ අවස්ථාවකි මෙය.

"මට ආවිරිය කීව හමුදුරුවනේ."
"හැබෑද බොල ..... ඉස්පැක්ටර් මහත්තය තවමත් ලේ ගලන තැනැත්තා දිහා බලල ඔරවනව.
"තෝ මොකටද මූට උඩය කීවෙ".
"මට පාත්තය කීව හාමුදුරුවනේ.ම්..... තොපි යන්ඩ එන්ඩ තැනක් නැති අභිගුණ්ඩිකයො වාගෙ. ලංකාවෙ හැම

පැත්තෙන් ම ඇවිත් මේ කැලේට රිංගපු වඳුරු මොටයි නේද....? ම්..... ඈ බොලව්..... ඩිග්හ්..... ඩිග්හ්..... එහෙම පාත් වුණු තොපිට මොන බේදයක්ද ?..... ම්..... කියා ගන්නවද ? ඇයි තොපි කතා නැත්තෙ ? ඩිග්හ්..... ඩිග්හ්.....උගුඩුවෝ.....චටස්..... පටාස් .....''(උපරතන හිමි 1990: 09).

සාමාන්‍යයෙන් ලාංකිකයන් අතර ආවාහ විවාහ කටයුතුවල දී කුලය පිළිබඳ සාධකය ඉස්මතු වන බව දක්නට ලැබෙන ප්‍රකට කරුණකි. කොලනිවාසින්ට ද එය තදබල ප්‍රශ්නයක් වූ බව ශාන්ති දිසානායකගේ **වරාමල්** නවකතාවෙන් ද දත හැකි ය. එහි කපුරු බණ්ඩාගේ පුතු වන මහතුන් ඉතා පහත් යැයි සම්මත කුලයක තරුණියක වන සොබනි සමඟ පෙමින් බැඳෙන අතර එය දැන ගන්නා කපුරු බණ්ඩා පවසන වදන් වූයේ,

''උඹට ඕනෑ ඒකිම නං ඕක ම කොරගනිං. හැබැයි පුතේ මං මැහිතෙල් බොනවා ඒකාන්තයි''යන්න ය (දිසානායක 1999:150).
කුල ප්‍රශ්නය සම්බන්ධ ව සොබනිගේ අදහස වූයේ,
''ඔයාව ඔයාගෙ පවුලෙන් අයිං කරයි. ඔයාට නැදැයොත් නැතුව යයි. මරණෙකට මගුලකටවත් ඔයාව වැද්ද ගන්න එකක් නෑ'' යනුවෙනි. (දිසානායක 1999:168).

කොලණිවාසීන් තුළ මෙන් ම සාම්ප්‍රදායික ගම්මු අතර ද කුලය පිළිබඳ සාධකයට විශේෂයෙන් ම විවාහයක් වැනි කටයුත්තක දී මූලික අවධානයක් යොමු ව තිබූ බව ද එම සමාජීය තත්ත්වයේ දී දෙපිරිස අතර සමතාවක් තිබෙන බව ද කිව හැකි ය.

තරුණ පරපුර, ඔවුන්ගේ ආකල්ප හා විප්ලවය වෙත යොමු වීම
ජානපදිකයින්ගේ දෙවන පරම්පරාවේ දරුවන්ට නිසි අධ්‍යාපනයක් ලැබීමට අවස්ථාව උදා වීමෙන් ඔවුන් තම ජනපදයන් තුළ මෙන් ම සමස්ත සමාජය තුළ ම පවතින සැබෑ තතු අවබෝධ කර ගැනීමෙහි ලා අවශ්‍ය බුද්ධිය

සම්පාදනය කර ගත් පිරිසක් වූහ. යුක්තිය හා සාධාරණය වෙනුවෙනුත්, සැබෑ යථාර්ථය හඳුනා ගැනීමෙහි දී ත් ප්‍රමුඛස්ථානයක් නිතැතින් ම මොවුන්ට හිමි විය. මොවුන් මතු කළ ප්‍රශ්න, නැගූ හඬ සත්‍යයට වඩාත් ළං වූ බවත්, යථාර්ථය එය ම බවත් මෙම නවකතා හරහා හඳුනා ගත හැකි ය. ලාංකික සමාජ තතු සමාජ විද්‍යාත්මක මිණුම් දණ්ඩකින් ඇගයීමේ දී මෙම තරුණ ජානපදිකයින්ගේ හඬ ද බොහෝ සේවයක් සලසන බව පෙනේ. එවන් බුද්ධිමත් තරුණ තරුණියන් කිහිපදෙනෙකු ම පාඨකයාට මේ ජනපද මතින් ම හඳුනා ගත හැකි ය. සුබද්‍රා, සේකර, මහතුන් හා ගුණදාස ඉන් කැපී පෙනෙන චරිතයෝ ය.

සමකාලීන ලාංකේය සමාජයෙහි ඔඩුදුවා ඇති ප්‍රබල ප්‍රශ්නයක් වනුයේ රැකියා විරහිත උපාධිධාරීන්ගේ ප්‍රශ්නය යි. **පැලැනෙත් වෙත් කළ ඉඩම්හි** මුදලිහාමිගේ දියණිය ද විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ලැබූ, රැකියා විරහිත උපාධිධාරිනියකි. කාන්තාවන්ට ම සුවිශේෂී වූ ඇතැම් මානුෂීය ගැටලු පිළිබඳ ව කතා කිරීමටත් සමකාලීන සමාජ ගැටලු පිළිබඳ ව අවධානය යොමු කිරීමටත් මේ හරහා කතුවරයාට ඉඩ ප්‍රස්ථා ලැබී ඇති බව පෙනේ.

"....රැකියා නැති උපාධිධාරීන්ගේ සම්මේලනයට සහභාගී වීම සඳහා සුබද්‍රාත් එදා ගියා. චන්ද්‍රලතාත් එදා එතන හිටියා. ඇය අවසාන වර්ෂයෙ ඉන්න කොට සුබද්‍රල උන්නෙ මුල් අවුරුද්දෙ. චන්ද්‍රලතාට තවමත් රැකියාවක් නැහැ. විශ්වවිද්‍යාලයේ දී අනෙක් ශිෂ්‍යාවො චන්ද්‍රලතාට ආමන්ත්‍රණය කළේ අක්ක කියලයි. දැන් හුගක් වයස ඉක්මී ගිය බව ඇගෙන් ප්‍රදර්ශනය වෙනව. සමහර විට බඩහඩි මුදලාලියෙක්වත් චන්ද්‍රලතා සහායට ගනී ද කියන්න බැහැ. මේ තත්වය උදා වෙලා ඇත්තේ චන්ද්‍රලතාට පමණක් නොවන බව සුබද්‍රා දන්නවා. එදා සම්මේලනයට ආව බොහෝ උපාධිධාරී කාන්තාවො විවාහ වයස ඉක්මවමින් සිටි අයයි. සමහරු විවාහ වෙලා උන්නෙ බස් කොන්දොස්තරල පී. සීල සමගයි. රැකියාවක් නොමැතිකම නිසා සාමාන්‍ය ගොවියන් හා විවාහ වුණ අම්මාවරුත් එදා සම්මේලනයට ඇවිත් උන්නා. සම්මේලනයෙන් සිදුවුණු වැඩකුත් නැහැ.

මුලින් ම නිලතලවලට සම්මේලන සංවිධායකයො ම පත් වුණා. ....සම්මේලනයේ මූලිකයන්ට රැකියා ලැබුණු බව ත් දිනවල ආරංචි වුණා''(උපරතන හිමි 1990:157-158).

**කටු ඉඹුලෙහි** දී හමු වන සේකර යනු රාජාංගනයේ ජනපදයට පැමිණි උත්සාහයෙන් යමක් උපයා ගත් ජේම්ස් නැමැත්තාගේ පුත්‍රයා ය. ඔහු විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය ලබන්නෙකි. පාසැල් ගුරුවරයෙකු වන මුතුගල මහතා හා ඇසුරු කිරීමෙන් ඔහුගේ අංකුර බුද්ධිය තවත් ඔප් නැංවීමට හේතුවක් වූ බව ද පෙනේ. පවතින දේශපාලනික, සාමාජීය වාතාවරණය හමුවේ සැබෑ තතු අවබෝධ කර ගැනීමෙහි ප්‍රයත්නයක සේකර යෙදෙන බව පෙනේ. තව ද පියසේන කහඳගමගේගේ **නිම්නයක අඬහැරේ** නවකතාවෙහි විප්ලවය සඳහා දායකත්වය සපයනු ලබන තරුණ පිරිස් නැගී එනු ලබන්නේ සේකර වැනි උගත්, බුද්ධිමය අංකුරයන්ගෙන් හෙබි තරුණයන්ගෙන් බව ද වටහා ගත හැකි ය. මුතුගල මහතා සේකර හා පවසන වදන් මගින් ජනපද තුළ ම ක්‍රියාත්මක වූ අසාධාරණ තතු වටහා ගත හැකි ය. ජනපද පිහිටුවීමෙන් රජයන් බලාපොරොත්තු වූ අපේක්ෂා ඉටු නො වුණු බව්, පොදු ජන අපේක්ෂා බොහෝවිට ඉටු නො වන බව පෙන්වා දී ඇත.

''ගොවිජනපද ඇතිකෙරුවෙනං බොහොම උතුම් පරමාර්ථ ඇතුව.... ක්‍රියාත්මක වන විදිහ නං මං දන්නෑ. මේව ඔක්කොම සැලසුම් කරල තියෙන විදිහ වැරදියි. එතනයි ප්‍රශ්නෙ....

''ඉඩම් නැතිව හිටපු මිනිස්සු වැඩි වුණා. ඒකයි ආණ්ඩුව ඉඩම් දුන්නෙ....ඒක මම පිළිගන්නව....ඒත් මිට වඩා සැලසුමක් තියෙන විදියට කරන්ඩ තිබුණ.... දැං බලමු....මේ ජනපදකාරයින්ගෙ දරුවො ලොකු මහත් වුණාම කෝ ඒ අයට ඉඩං එතකොට ආයෙත් ප්‍රශ්නෙ මුල .... ඉඩං දුන්නෙ කාටද....? දැං ඉන්නෙ එච්චගෙ කවුද.... එච්චරයි හොයල බලන්ඩ ඕන''(ධර්මසිරි 1999: 145).

"....එක් අතකට අවුරුදු ගණනාවක් තිස්සේ විවිධ අතවරයනට ලක් වූ ජේම්ස් වැනි පියෙකුගේ පුතෙකු වශයෙන් මෙම සීමාවන් බිඳගෙන ඉදිරියට ඒමේ අයිතියක් ඔහුට ඇතැයි සේකරට සිතෙයි...."(ධර්මසිරි 1999:146).

තරුණ සිත්හි සාධාරණය හා යුක්තිය වෙනුවෙන් වෛරයේ ගිණි දළු හිස ඔසවන අයුරු ඉතා සියුම් අයුරින් සේකරගේ සිතැඟි ඔස්සේ හඳුනා ගත හැකි ය. තරුණ පිරිස් මෙවන් තත්ත්වයන්ට යොමු කරලීමට සමාජ, දේශපාලන බලවේග වික්‍රාකාරයෙන් හෝ බල පා ඇති බව බුද්ධිමත් පාඨකයා හඳුනා ගනී. එසේ ම අංකුර බුද්ධිමතෙකුගේ චරිත ලක්ෂණ සේකරගේ චරිතයට මුසු කොට ඇත.

පැලෑතෙන් වෙන් කළ ඉඩම්හි සුබද්‍රාගේ චරිතය මගින් කතුවරයාගේ දෘෂ්ටිය ගෙන එන අතර කවු ඉඹුලෙහි දී සේකර හා මුතුගල මහතා යන බුද්ධිමතුන් මගින් කතුවර ආකල්ප හා අදහස් මුදා හැර ඇත. උගත් බුද්ධිමතුන් වූ මෙම චරිත තම දෘෂ්ටීන් හෙළිකිරීම සඳහා යෝග්‍ය. පරිදි යොදාගෙන තිබීමෙන් නවකතාවන්හි කලාත්මක අංශයන්හි වර්ධනය සඳහා දායකත්වය සපයා ඇත.

තරුණ පිරිස් 1971 අප්‍රේල් කැරැල්ල සඳහා දායකත්වය සැපයීමට හේතු වූ සමාජ, ආර්ථික හා දේශපාලනික කරුණු පිළිබඳ ව තරමක් ගැඹුරින් සාකච්ඡා වන්නේ තිමිතයක අඬහැරේ දී ය. එහි දී හඳුනා ගැනීමට ලැබෙන ගුණදාස විප්ලවයෙහි නියමුවෙකු වන්නේ ඔහුට දිගින් දිගට ම සිදු වන අසාධාරණකම් හේතුවෙනි. මුල්කාලීන ජානපදිකයෙකු වූ කිරිබණ්ඩාගේ පුතු වන්නේ ඔහු ය. අවසන විප්ලවය අසාර්ථක වන අතර ඔහු සිය පියා නිදහස් කර ගනු වස් හමුදාවට බැඳීමට තීරණය කර යි. ඉතා හරවත් සමාජ කතිකාවතක් පාඨකයා හමුවේ නිරාවරණය කිරීමට පියසේන කහඳගමගේ මෙම නවකතාව හරහා යම් ප්‍රයත්නයක් දරා ඇති බව කිව යුතු ය. මෑත කාලීන ව සිදු වූ විශාල තරුණ සංහාරයට බල පෑ හේතු සාධකයන්හි මූල බීජ මෙහි අන්තර්ගත වී ඇතැයි සිතේ. විශේෂයෙන් ම උගතුන්ට රැකියා නො ලැබීමේ හේතුවෙන් තරුණ පරපුර අරමුණක් හෝ

අපේක්ෂාවක් නොමැති ව වල්මත් වූහ. එනිසා සමාජ අපචාරී ක්‍රියාවන්ට ද නිතැතින් ම ඔවුන් ලක් වූ අයුරු හේතුඵල සම්බන්ධතා සහිත ව මතු කර ලීමට කතුවරයා උත්සාහ දරා ඇත. නමුත් නවකතාවෙහි පසු අඩ කලාත්මක ලක්ෂණවලින් තොර ප්‍රචාරාත්මක ස්වරූපයක් ගෙන ඇත.

තරුණ කොටස්වලට සිදු වූ අසාධාරණ හා අකටයුතුකම් පිළිබඳ ව කතුවරයා සිය විචාරාක්ෂිය සියුම් ලෙස අවදි කරවමින් වැඩි අවධානයක් 71 තරුණ නැගිටීම් සඳහා හේතුකාරක වූ කරුණු වෙත යොමු කරවන බව පෙනේ. දාස මගින් නිරූපණය වන්නේ සමස්ත මානව පරපුර යැයි සිතිය හැකි ය. දාස වැනි තරුණයින් ව්‍යාපාරය වෙත ඇදී යාමට හේතු සාධක සමාජ විද්‍යාත්මක අගයක් ගනී.

"කී වරක් මාව කැපුව ද? උන්ට බලය තියෙනකල් ඔහොම කරාවි. ඒව පරාජය කරන්න තියෙන මාර්ගය තමයි විප්ලවය. කොලනියෙ ඉඩම් නැති කොල්ලො සිය ගණනක් ඉන්නව. කොහොඹානෙ මහත්තයට කුඹුරු අක්කර හැට ගාණක් තියෙනව. එව්ව දෙමළ මිනිස්සුන්ගෙන් තුට්ටුවට දෙකට ගත්ත ඒව. අපි බලයට ආපු දාට ඒව අරගෙන ඉඩම් නැති උන්ට අක්කරේ ගණනෙ බෙදල දෙනව" (කහඳගමගේ 1991:161).

**නිම්නයක අඬහැරේහි** හමු වන විප්ලව නායකයකු වන සේන මුළු කොලනියෙන් ම උසස් ලෙස ජ්‍යෙෂ්ඨ විභාගය සමත්වන්නා ය. මුල දී ඉතා හික්මුණු පුද්ගලයෙකු වූ ඔහු විප්ලවයට යොමු වීමට හේතු වූ කරුණු පාසල් ගුරුවරයාගේ ඇයැදුමෙන් කිරිබණ්ඩා විසින් කියා පාතු ලබන්නේ පාඨක මනස ද වැදගත් කාලීන මාතෘකාවක් වෙත යොමු කරලමිනි.

"මැනේජර් උන්නැහේ තමයි මහත්තයා, ඔය අපරාදෙට මුල් වුණේ. කොල්ලො දෙන්නම ජන්දෙට වැඩ කෙරුවෙ අනික් පැත්තට. මැනේජර් මහත්තයලැයි පැත්ත දිනුව. විරුද්දෙට වැඩ කෙරුවයි කියල උන්නැහේ අපේ කොල්ලො එක්ක හිත හොඳ මදි. පළිගන්න බලාගෙන හිටිය. ලොකු එකා ඉගෙන ගත්තෙ නැහැ. ඌට රස්සාවල් ඉල්ලන්න බැහැ. ඒක හින්ද

ඌ'ට කොරන්න දෙයක් නැහැ. ඒකටත් එක්ක පොඩි ඒකාගෙන් පළිගත්ත. ඌ රස්සාවල් ගණනක් ඉල්ලුව. බස්කොන්දොස්තරකම ඉල්ලුව. මැනේජර් මහත්තය කොල්ලගෙ මූණට ම මන්ත්‍රීතුමාට කියල තියෙනව විරුද්දෙට වැඩ කොළයි කියල. ඒකට මන්ත්‍රීතුමාගෙ ලියුම ගේන්න කිව්ව. ලියුම හම්බ වුණේ නැහැ. රස්සාව හම්බ වුණෙත් නැහැ. පොලිසියට තේරිච්ච වෙලාවෙ පෙත්සම් ගහල ඌට යන්න තිබ්බච්ච ඉඩ ඇහිරුව. ග්‍රාමසේවකකමට හිටියෙ ඌ තමයි පුදුස්සා ඒක කළු ජේමයගෙ මල්ලිට අරන් දුන්න. ඒකට මෙහාට ජන්දෙවත් තිබුණෙ නැහැ. ඒගොල්ලන්ගෙ ආණ්ඩුව තියෙනකල් රස්සාවකට යන්න දෙන්නෙ නෑ කියල තිබුණ නෙව. ඉතින් ඒ ආණ්ඩුව තියෙනකල් උන්ට මොකකටවත් යන්න ඉඩ තිබ්බෙ නෑ. ඒක හින්දා ඌ හිටියෙ හිතේ අමාරුවෙං තමයි. ගිය පාරෙ ජන්දෙටත් වැඩ කෙරුව. ඒ පැත්ත දිනුව. ගුරුපත්වීම් දෙනකොට මේකගෙ නම මුලට තිබ්බල තියෙන්නෙ. ඒක පක්ෂ සංවිධායකගෙ - පුංචිරාළගෙ ගෑනිගෙ මළයට දුන්න. කොහොම වුණත් ඊළඟ වතාවට දෙනවයි කියල මංත්‍රීතුමා ම කිව්වලු. කොහොම හරි රස්සාවක් ගන්න තිබුණු වෙලාවෙ තමයි මහත්තයො මේ නස්පැත්තිය කොර ගත්තෙ''(කහඳගමගේ 1991:16-17).

වරාමල්හි තරුණ පරපුර මුහුණ දුන් උග්‍ර ඉඩම් හිඟය පිළිබඳ ව අවධානය යොමු කොට ඇත්තේ මහතුන්ගේ චරිතය මගින් ය. මෙවැනි වූ විවිධාකාර බාධක හමුවේ මහතුන් නමැති තරුණයා නීති විරෝධී ක්‍රියාවන්ට නැඹුරු වන අයුරු කතුවරිය කියාපානුයේ අපූරු සංයමයකිනි.

''....බොහෝ විට එය කෙසෙල් කැනක්, වට්ටක්කා ගෙඩියක් හෝ මිරිස් උරයක් විය හැකිය. ඇරුන ඇසින් හා තදින් ගැහෙන හදින් සොරකමට බට තරුණයා කෙසෙල් කැනෙන්, වට්ටක්කා ගෙඩියෙන් රත්තරංවලට පියමං කළේ ඉක්මනින් නොවේ. එමෙන් ම ඉතාමත් සෙමින් ද නොවේ." එහි අනිවාර්ය ප්‍රතිඵලය ද ඔහු අත්වින්දේය''.

''නැගපිය පරය පීජ් එකට.......යි'' තට්ටමට වැදෙන පා පහරත්, කුණුහරුපත් මහතුන් තුළ සැඟව හුන් කාරුණික මිනිසා මරා දැම්මේය''(දිසානායක 1999: 14).

පවතින සමාජ ක්‍රමයන් විසින් පුද්ගල චරිත හැඩ ගස්වන අයුරු දාස, මහතුන් වැනි චරිතයන්ගෙන් අපූරුවට කියා පාති. සමාජ, දේශපාලනික වාතාවරණය චරිතයන්හි කායික, මානසික ස්වරූපය සැකසීමෙහි ලා ප්‍රබල දායකත්වයක් දක්වන අයුරුත්, නවකතාව හුදු අහස් විමනක් හෝ සුරංගනා ලොවක් නො වන බවත් තවදුරටත් අපට මෙමගින් ප්‍රත්‍යක්‍ෂ වේ.

අපේක්‍ෂාභංගත්වය හා ආත්මීය හුදකලාභාවය

ජීවිතයෙහි බොහෝ අවස්ථාවන්හි දී තමන් අපේක්‍ෂිත බලාපොරොත්තු ඉටු නො වීම සාමාන්‍යයෙන් මනුෂ්‍ය ජීවිතයේ ම කොටසක් ලෙස ගත හැකි මනුෂ්‍යත්වයට උරුම වූ සනාථන දහමකි. ඉතා දැඩි බලාපොරොත්තු සහිත ව නව ජීවිතයක් අපේක්‍ෂාවෙන් ගොවිජනපද වෙත පැමිණි ජනතාව අවසන කිසිදු ඵල ප්‍රයෝජනයක් ඉන් නො ලබා අපේක්‍ෂාභංගත්වයට පත් වන අයුරුත්, ආත්මීය වශයෙන් හුදකලා වන අයුරුත් මෙම නවකතා මගින් විදාරණය වේ. නවකතා බහුතරයකින් නිරූපිත වන්නේ මෙම තත්ත්වය බව කිව යුතු ය.

ලක්දිව දකුණු පළාතේ ගිං ගඟ සංවර්ධන ව්‍යාපෘතිය හේතු කොට ගෙන පාරම්පරික ව එහි විසූ ජනතාවකගේ ජීවන රටාව උඩු යටිකුරු වන අයුරු හා ඔවුන් අසරණ වන අයුරු මහාචාර්ය තිස්ස කාරියවසම්ගේ **අපට යන්න තැනක් නෑ** චුල්ල නවකතාවෙහි නිරූපිත ය. මේ බද්දේගම පිරිස තම ඉඩම් වෙනුවට ලුණුගම්වෙහෙර ජනපදයෙහි ඉඩම් ලබති. එනමුත් ඔවුන්ගේ මුළු ආත්මය ම වෙළී පවතිනුයේ තමන්ගේ ගම සමඟ ය. නව පරිසරයෙහි පවතින දුෂ්කරතා හේතු කොට ගෙන මොවුන් ජීවිතවලට පෙම් බැඳීම අත් හරින අයුරුත්, අපේක්‍ෂාභංගත්වයට පත් වන අයුරුත් වටහා ගත හැකි ය. නව පරිසරයක හුදකලාභාවයට පත් වන ජන

කොටසකගේ ආත්මීය විලාපය ගැබ් කොට ගත්.. අවස්ථා බොහෝ සෙයින් ම මෙහි විද්‍යමාන ය.

මෙම චුල්ල නවකතාව මගින් වෙනත් ගොවිජනපද වස්තු විෂය කොටගත් නවකතාවන්හි විද්‍යමාන නො වන පැතිමානයක් කරා පාඨකයා ව රැගෙන ගොස් ඇත. සාමාන්‍යයෙන් ගොවිජනපද ව්‍යාපාර වෙත පිවිසෙන බොහෝ ජන කොටස් කිසිදු බිම් අඟලක් සඳහා හිමිකාරත්වයක් නො ලැබූවන් වීම විශේෂ ලක්ෂණයකි. එහෙත් මෙහි අත්දැකීම් ඉදිරිපත් කරන සුමනදාස, මව හා පියාට උදා වූයේ ඊට වෙනස් වූ වාතාවරණයකි. ඔවුහු පාරම්පරික ඉඩකඩම් හිමි පුද්ගලයෝ ය. සංවර්ධන කටයුතු හේතුවෙනි ඔවුන්ට සිය ඉඩකඩම් අහිමි වනුයේ. එසේ ම ගොවිජනපද වස්තු විෂය කර ගනිමින් ප්‍රථම වරට ඉදිරිපත් කරන ලද මඩවල එස්. රත්නායකගේ අක්කර පහ නවකතාවෙහි ද සේන ඇතුළු පවුලට මිණිපේ ගොවිජනපද ව්‍යාපාරය වෙත පැමිණීමට සිදු වන්නේ ද විවිධ හේතූන් මත එතෙක් ඔවුන් ජීවත් වූ සමන්තැන්න නම් ප්‍රදේශය අහිමි වීම හේතු කොට ගෙන ය.

මෙම ආගන්තුක ප්‍රදේශයේ දී සුමනදාසලාගේ පවුල ආධ්‍යාත්මික ව හුදකලා වන අන්දම කතුවරයා ග්‍රහණය කොට ගෙන ඇත්තේ මනුෂ්‍යත්වය පිළිබඳ ව සියුම් අවබෝධයක් ඇත්තෙකු පරිද්දෙනි. බොහෝ නවකතාකතුවරු කතා බහට ලක් නො කළ පාර්ශවයක් කතුවරයා අවලෝකනය කර ඇත. ඔවුන් කෙතෙක් දුරට ආත්මීය වශයෙන් හුදකලාභාවයට පත් ව ඇත් දැයි සුමනදාසගේ සිතුවිලි ඔස්සේ හඳුනා ගත හැකි ය. එසේ ම ඔවුනගේ අපේක්ෂාභංගත්වය ද හඳුනා ගත හැකි ය.

"වතුර ටිකක් නැතුව ගිනි ගහන අව්වේ පිච්චි පිච්චි කරපු වැඩ වෙනුවෙන් අපට ලැබුණෙ මොනවාද ? අපි දවසින් දවස බලාගෙන හිටියෙ වතුර ටිකක් ලැබිල අපේ මඩ කුඹුරු ටික කර ගන්නයි. නමුත් ඒක හීනයක් වගේ වෙලා. තව අවුරුදු කීයක් ඔය විදියට ඉන්න වේද කියල කියන්න අමාරුයි"(කාරියවසම් 1998:82).

''එදා දවල්ට ද අපට කෑම පාර්සලයක් බැගින් ලැබුණි. මේ කෑම අපට අල්ලන්නෙ නැත. ටිකෙන් ටික අප අනාථයන් වී ගෙන එතියි අපට සිතෙන්නට විය. තාත්තා තුළ ඇති වේදනාව මතුවන්නේ මුහුණෙන් පමණි. තාත්තා වචනයක්වත් කතා නැතුව මේ තත්ත්වයට මුහුණ දෙයි''(කාරියවසම් 1998:77).

සරත් ධර්මසිරිගේ **කටු ඉඹුල** නවකතාවහි ජේම්ස් ජීවිත කාලය ම අනුන් වෙනුවෙන් දහඩිය වගුරා අවසන රාජාංගන ජනපදය වෙත පැමිණෙනුයේ මහත් උද්දාමයෙන් යුතු ව අභිනව ජීවිතයක් ආරම්භ කිරීම සඳහා ය. නව ජීවිතයක් සිතින් මෙන් ම කයින් ද පැතූ ජේම්ස් විවාහ වී සිටියේ සෙයිදා සමග ය. ඔහුට විමලාවතී නමින් දියණියක් ද සේකර නමින් පුත්‍රයෙක් ද විය. දියණිය ප්‍රේමලාල් නමැති ගුරුවරයා හා හොර රහසේ ම පැන යයි. බිරිඳ ද අවසන දී ඔහුට ද්‍රෝහි වේ. ඇය ද ඉන් මහත් සේ සන්තාපයට පත් වන අතර රාජාංගන වැවට පැන ජීවිතය තොර කර ගනී. ජීවිත කාලයක් පුරා හරි හම්බ කර ගත් දේ ඔහුට අහිමි වන අතර ඔද්දල් වූ මනසක් සහිත පරාජිත පුද්ගලයෙකු ලෙස ජීවිතයෙන් ම ඔහු පරාජය ලබන අයුරු නවකතාව අවසානයේ දී කියවේ. ජේම්ස් වැන්නන්ගේ අපේක්ෂාභංගත්වයට තුඩු දුන් හේතු සාධක හා සමාජ වටපිටාව නිර්මාණය කිරීමෙහි ලා දායකත්වය සැපයූ බලවේග සියුම් ව අවධානයට නතු කළ යුතු ප්‍රශ්න ලෙස ගත හැකි ය. තතු එසේ වුව ද අපේක්ෂා හා ප්‍රාර්ථනා පොදි බැඳ ගෙන මිනිසා යන මෙම දුෂ්කර දිවි ගමනේ දී විවිධ බාධක හමු වන අයුරුත්, අසරණයින් තවත් අසරණ කරන අයුරුත් වටහා ගැනීම නම් එතරම් දුෂ්කර නො වනු ඇත.

ලැන්ටිස්ගේ බිරිඳ ද විවාහ වී රාජාංගනය වෙත පැමිණෙනුයේ දහසක් බලාපොරොත්තු සහිත ව ය. එහෙත් ඇයගේ අපේක්ෂා ඉටු වී ද ? කොලනි සමාජයෙහි ශීඝ්‍රයෙන් සාරධර්ම පිරිහී යාමේ ප්‍රතිඵලයක් වසයෙන් ලැන්ටිස් අරක්කු වෙළඳාමට යොමු වූ අතර ජනපද නිලධාරීන්ගේත්, කොලනි

වැසියන්ගේත් වුවමනා එපාකම් පිරිමැසීමට සිදු වූයේ ඔහුගේ බිරිඳට ය.

නිම්නයක අඬහැරෙහි ද දාස ඇතුළු පිරිස මහත් අපේක්ෂාසහගත ව විප්ලවය වෙත ඇදී ගිය ද කරුණු නිසියාකාර ව අවබෝධ කොට ගත නො හැකි වීමෙන් ඔවුහු ද අසාර්ථක භාවයට පත් වූහ.

වරාමල් නවකතාව මගින් ද අපට හමුවන්නේ ජීවිත සටනින් පැර දී අපේක්ෂාභංගත්වයට පත් වූ තවත් මනුෂ්‍ය ජීවිත කිහිපයකි. විමලාවතී ඇතුළු සියල්ලෝ ම බලාපොරොත්තු තබා සිටියේ අධ්‍යයන කටයුතුවලට සාමර්ථ්‍යයක් දැක් වූ නිලන්තිගේ අනාගතය වෙත ය. ඇය ශිෂ්‍යත්ව විභාගය සමත් ව අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට තේරී නේවාසික ව අධ්‍යාපනය ලබමින් කටයුතු කළ ද අවසන දී නාගරික රැල්ලට හසු වීමෙන් තම අධ්‍යාපනය, පවුලේ අපේක්ෂා පමණක් නො ව සිය පවිත්‍රත්වය ද කෙලෙසා ගත්තා ය. කපුරු බණ්ඩාගේ හා ඩිංගිරි මැණිකාගේ පුතු වූ මහතුන්ට තම අපේක්ෂිත යුවතිය හා සරණ යාමට නො හැකි වන්නේ කුල ප්‍රශ්නයක් පැන නැගීම හේතුවෙනි. එනිසා දෙමාපිය කැමැත්ත මත ඔහු ආරියවතී නම් කාන්තාව විවාහ කර ගත්ත ද ආධ්‍යාත්මික වසයෙන් ජීවත් වූයේ තමන් පෙම් කළ එහෙත් සමාජ සම්මතයන්ට පිටු පෑ නො හැකි බැවින් තමුන්ට අහිමි වූ පහත් යයි සම්මත කුලයකට අයත් වූ සොබනී සමග ය. දහසකුත් අපේක්ෂා තම දියණිය වූ නිලන්ති වෙත තබා තිබූ විමලාවතී නම් දිරිය මව ද අවසන දී අත්පත් කොට ගත් යමක් නොමැත. මෙම සියලු චරිත ජීවිත මහෝසයෙහි වල්මත් වූ, අසරණ වූ, පවතින සමාජ ක්‍රමයන් විසින් තලා පෙලා සකස් කරන ලද්දා වූ චරිතයෝ වෙති.

## නිගමනය

ශ්‍රී ලාංකික ගොවි ජනපද ව්‍යාපාරයන්හි ආභ්‍යන්තරික තොරතුරු ගවේෂණය කරන විද්‍යාර්ථියෙකුට අනූව දශකයෙහි ලියැවුණු යථෝක්ත නවකතා නිර්මාණ මගින් වැදගත් මූලාශ්‍රය සපයා ගත හැකි අතර ඒවා සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයන්ගෙන් ද අගය කළ හැකි බව

දැක්විය හැකි ය. එසේ ම මෙම ජනපද ව්‍යාපාර ඇතුළත විවිධ වූ මුහුණුවරයන්ගෙන් යුක්ත වූ ගැටළුසහගත තත්ත්වයන් උද්ගත වූ අයුරුත්, සමස්ත ජනපද පුරා ම අසහනය හා පීඩනය ව්‍යාප්ත වූ අයුරුත්, ගොවි ජනපද පිහිටු වීමෙන් රජයන් බලාපොරොත්තු වූ අභිමතාර්ථයන් ඉටු නො වූ අයුරුත් පසක් කොට ගැනීම එතරම් දුෂ්කර නො වේ. තතු කෙසේ වුව ද මෙම නිර්මාණකරුවන් සාහිත්‍යධරයින් වසයෙන් ජානපදිකයින්ගේ ආධ්‍යාත්මික තතු නිරූපණයෙහි ලා දැඩි නම්‍යතාවක් දක්වා තිබීම ද පොදුවේ විද්‍යමාන වන ලක්ෂණයකි.

මෙහි දී අවධානයට ලක්වුණු කිසිදු නවකතාවක හෝ ගොවිජනපද වර්ණනා කිරීමේ අභිලාෂයක් විද්‍යමාන නො වුණු බව පැහැදිලි ය. සාම්ප්‍රදායික සමාජය කුමන දෘෂ්ටියකින් හෝ ආකල්පයකින් මොවුන්ගේ ජීවිත රටාව අවලෝකනය කළ ද මෙම ජන සමූහය ද මනුෂ්‍යත්වයට හිමි පොදු ලක්ෂණයන්ගෙන් සමුපේත වන පිරිසක් බවත්, ජීවිත මහෝඝයෙහි සියල්ලන් ම අනවරත අරගලයක යෙදෙන බවත් අවසානයේ දී පසක් කොට ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


උපරතන හිමි, වීරපොකුණේ. 1990. *පැළෑනෙන් වෙන් කළ ඉඩම්*. නුගේගොඩ: දීපානි මුද්‍රණ හා ප්‍රකාශන.

කහඳගමගේ, පියසේන. 1991. *නිම්නයක අඬහැරේ*. මරදාන: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කාරියවසම්, තිස්ස. 1998. *අපට යන්න තැනක් නෑ*. මරදාන: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, ශාන්ති. 1999. *වරාමල්*. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ධර්මසිරි, සරත්. 1999. *කටු ඉඹුල*. මරදාන: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජයරත්නමැණිකේ, අතුලා. 1999. *වපසරිය*. කොට්ටාව: සාර ප්‍රකාශන.

*Encyclopedia of Britannia*. 2005. Dulux Edition. USA: